**කළුතර ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 04 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2007 සිට 2018 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව ගෙවා තිබූ රු.211,962 ක් වූ හිඟ වැටුප් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | හිඟ වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසාගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී අදාල වියදම දරන ලද බව දන්වමි. |
| (ii) | වැටුප් හා වේතන වැය ශිර්ෂයෙන් රු.57,600 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ අතර, එකී වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.183,540 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.3,281,111 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | වර්ෂය අවසානයේ සමීක්ෂණ කටයුතු අවසන් නොකල බැවින් පොත් අගය ගිණුම්ගත කල බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.18,882,930 ක් වූ ගිණුම් විෂයන් 02 ක් හා ඒවාට අදාළ උපලේඛන අතර රු.4,356,613 ක හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.3,199,031 ක් වූ තවත් ගිණුම් විෂයයන් 02 ක් හා වැය ලෙජරය අතර රු.254,969 ක වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරිම් කල යුතුය. | මේ සම්බන්ධයෙන් පරික්ෂා කර ඉදිරියේදි ගිණුම නිවැරදි කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ව්‍යාපෘති 03ක් වෙනුවෙන් හා ඉකුත් වර්ෂවල ලැබිය යුතු රු. 1,460,165 ක මුදලක් සභාවට ලැබී නොතිබුණි. | අදාල මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය. | කළුතර ප්‍රාදේශිය ලේකම් හා පළාත් පාලන කොමසාරිස්ගෙන් ලැබිය යුතු බව දන්වමි. |
| (ආ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ව්‍යාපෘති 39 ක් වෙනුවෙන් කොන්ත්‍රාත් සමිති වෙත ගෙවිය යුතු රු.3,422,277 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | අදාල සමිති වෙත ගෙවීමට කටයුතු කල යුතුය. | ගෙවීම් කිරිමට කටයුතු කරමින් සිටින බව දන්වමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා රු.3,644,267 ක් වූ ලී බඩු උපකරණ ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කල යුතුය. | ඇතැම් වර්ෂ වලට අදාල ලී බඩු උපකරණ වල වටිනාකම් හඳුනාගත නොහැකි බවත්, ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බවත් දන්වමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ<br>(i) 21 වගන්තිය | | ඉදිකල හා ඉදිකිරීම් කලයුතු මාර්ග ඇතුලත්ව සභාව සතු මුළු මාර්ග පිලිබදව හදුනාගැනීමක් කර නොතිබුණි. | සභාව සතු මුළු මාර්ග පද්ධතිය හදුනාගත යුතුය. | අදාල කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |
| | (ii) 134(1) වගන්තිය | | සභාව විසින් වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | වරිපනම් බදු සඳහා නව හදුනාගැනීම් සිදු කළ යුතුය. | නව හදුනාගැනීම් සිදු කෙරෙමින් පවතින බව දන්වමි. |
| | (iii) 149 වගන්තිය | | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආයතන දෙකකින් සියයට එක දක්වා බදු මුදල් අයකර නොතිබුණි.තවද ආයතන 07 කින් හා ආපනශාලා ආදායම පමණක් සැලකිල්ලට ගෙන බදු අයකර ගෙන තිබුණි. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි සියළු ආයතන වලින් සියයට එකේ බදු අයකල යුතුය. | සියයට එකෙහි බදු ගෙවන ලෙස ආයතන වලට දන්වා ඇති බවත්, මෙම අය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වල නිරීක්ෂණ හා නිර්දේශ ඉල්ලා ඇති බව දන්වමි. |
| | (iv) 160 වගන්තිය | | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | හිග වරිපනම් කඩිනමින් අය කල යුතුය. | හිඟ මුදලින් කොටසක් අය කර ඇති බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1)(2) | 1,727,956 | ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉකුත් තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය | | වාහන 20 ක ඉන්ධන දැවීම පරික්ෂා කර නොතිබුණි. | වාහන වල ඉන්ධන දැවීම පරික්ෂා කල යුතුය. | ඉන්ධන දහනය පරික්ෂා කරමින් පවතින බව දන්වමි. |
| (ඈ) | 2018 නොවැම්බර් 16 දිනැති අංක 2098 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | 116,500 | වස්කඩුව උපකාර්යාල බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු 22 ක් වෙනුවෙන් රු.116,500 ක මුදලක් අයකර නොතිබුණි. | දැන්වීම් පුවරු ගාස්තු අය කල යුතුය. | මුදල් නොගෙවූ දැන්වීම් පුවරු වැඩි ප්‍රමාණයක් ගලවා ඇති බවත්, ඉතිරි පුවරු සඳහා මුදල් ගෙවන ලෙස දැන්වූ බවත් දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.58,581,142 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,712,853 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,467,358 | 10,708,440 | 10,283,908 | 6,691,260 | 9,957,320 | 10,802,034 | 7,481,956 | 5,777,486 |
| (ii) | කුලී | 276,600 | 322,800 | 292,300 | 57,500 | 276,600 | 276,600 | 249,600 | 27,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,562,000 | 3,891,908 | 3,891,934 | - | 2,460,000 | 682,209 | 3,497,320 | - |
| (iv) | වෙනත් ආදායම් | 75,000,000 | 75,000,000 | 57,729,893 | 90,666,065 | 25,707,733 | 13,000,000 | 80,578,627 | 28,801,298 |
| | | 88,305,958 | 89,923,148 | 14,468,142 | 97,414,825 | 38,401,653 | 24,760,843 | 91,807,503 | 44,605,784 |

2.2.2 ආදායම් රුස් කිරිමේ කාර්ය සාධනය

(අ) වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට වූ හිඟ බදු ශේෂය තුල වර්ෂ 01 ට වඩා අඩු හිඟය රු.670,199 ක් , වර්ෂ 01 -03 අතර හිඟය රු.3,221,665 ක් , වර්ෂ 03-05 අතර හිඟය රු.547,644 ක් හා වර්ෂ 05 ට වැඩි හිඟය රු.286,282 ක් විය. | හිඟය අය කිරිමට කටයුතු කල යුතුය. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ii) ග්‍රාම සේවක වසම් 03 කට අදාල වරිපනම් ඒකක 465 කට සමාලෝචිත වර්ෂයට බිල් කිරීම් රු.481,442 කින් කිසිඳු මුදලක් වර්ෂය තුල අයකර ගෙන නොතිබුණි. | වරිපනම් බද්දෙන් නිදහස් කර නැති බැවින් බදු අය කල යුතුය. | එම ප්‍රදේශ වල වරිපනම් බදු අය කිරිමේදී මතු වී ඇති ගැටළු නිසා පළාත් පාලන කොමසාරිස් විසින් දී ඇති උපදෙස් පරිදි කටයුතු කල යුතු බව දන්වමි. |

(ආ) ව්‍යාපාර හා කර්මාන්ත බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වස්කඩුව උපකාර්යාල බල ප්‍රදේශයේ 2018 වර්ෂයේදී ව්‍යාපාරික බදු අයකල වෛද්‍ය මධ්‍යස්ථාන 05 ක් සඳහා 2019 වර්ෂයේදී ව්‍යාපාර බදු අයකර නොතිබුණි. | ව්‍යාපාර බදු අය කල යුතුය. | 2019 වර්ෂයේ සමීක්ෂණ වාර්තා ලබා නොගත් බවත්, 2020 වර්ෂය සඳහා සමීක්ෂණය කල බව, හා ව්‍යාපාර බදු ගෙවන ලෙස දැන්වූ බව දන්වමි. |

(ඇ) බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වස්කඩුව උපකාර්යාල බල ප්‍රදේශයේ 2018 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලබාගත් ව්‍යාපාරික ආයතන 12 ක් 2019 වර්ෂය තුළ වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි | විවෘත කර ඇති ව්‍යාපාර සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කල යුතුය. | බලපත්‍ර ලබා ගත් ආයතන ලැයිස්තුව පමණක් ඉදිරිපත් කර ඇත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උසාවි දඩ<br>2017, 2018 හා 2019 යන වර්ෂවල පිළිවෙලින් රු.3,000,000 ක් , රු.3,000,000 ක් හා රු.15,000,000 ක් ලෙස බිල් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් ලැබී තිබුණේ රු.10,950 ක මුදලක් පමණි. | හිඟ ආදායම් අය කල යුතුය. | මුදල් ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) මුද්දර ගාස්තු<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව මුද්දර ගාස්තු රු.69,677,015 ක් විය. | හිඟ ආදායම් අය කල යුතුය. | මුදල් ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

2.2.4 ත්‍රි රෝද රථ ආදායම
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වස්කඩුව උපකාර්යාල බල ප්‍රදේශයේ ලියාපදිංචි ත්‍රි රෝද රථ ගාල් 34 හි ත්‍රි රෝද රථ 398 ක් පවතින නමුත් ත්‍රි රෝද රථ 39 කින් පමණක් මුදල් අයකර තිබුණි. ඒ අනුව හිඟ ත්‍රි රෝද රථ ආදායම රු.215,400 ක් විය. | හිඟ ආදායම් අය කල යුතුය. | සැලසුම් කල පරිදි ත්‍රි රෝද රථ ආදායම් අය කිරිමට නොහැකි වූ බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය | 2015 මැයි 28 ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථා 15 ක් හා 1988 |

| | | |
|---|---|---|
| නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | යුතුය. | ගැසට් පත්‍රයේ පල කරන ලද අතුරු ව්‍යවස්ථා 04 ක් ද ත්‍රිරෝද රථ සඳහා අතුරු ව්‍යවස්ථාවක්ද පනවා ගෙන ඇති බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිර ක්‍රියාකාරකම්

| | | |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිරව රු.මි.45.18 ක් වූ ව්‍යාපෘති 108 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුගතව කටයුතු කල යුතුය. | ස්වාභාවික ආපදා තත්ත්වයන් වැනි හේතුන් මත ප්‍රමුඛතාවය වෙනස් වන බැවින් ඒ අනුව කටයුතු කල බව දන්වමි. |

(ඇ) අවිධිමත් මාර්ග නඩත්තු

| | | |
|---|---|---|
| භෞතික සැලසුම් මංමාවත් යටතේ මංමාවත් අළුත්වැඩියා කිරීම සඳහා වාර්ෂිකව රු.මි.13 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණ ද, එකී ප්‍රතිපාදන ප්‍රමුඛතාවය අනුව වාර්ෂික නඩත්තු සැලැස්මක් නොතිබුණි. මාර්ග ඉදි කිරීම් හා නඩත්තු කටයුතු සඳහා රු.1,005,440 ක පිරිවැය වූ අමුද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද එවා භාවිතය පිලිබඳ විස්තරාත්මක තොරතුරු සභාව සතුව නොතිබුණි. | ප්‍රතිපාදන ප්‍රමුඛතාවය අනුව වාර්ෂික නඩත්තු සැලැස්මක් පිලියෙල කල යුතුය. | 2020 නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | | |
|---|---|---|
| කසළ කළමනාකරණය වෙනුවෙන් විධිමත් සැලැස්මක් පිළියෙල කර කසළ අපහරනය කිරීමේ සාර්ථක ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විධිමත් සැලැස්මකට අනුව කසළ කළමනාකරණය සිදු කල යුතුය. | සභා බල ප්‍රදේශයේ සියයට 35 ක් ආවරණය වන ලෙස කසල එක් රැස් කරන බව හා පස් අවුරුදු සැලැස්මක් කසළ කළමනාකරණය වෙනුවෙන් සකස් කරමින් පවතින බව දන්වමි. |

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 07 ක් හඳුනාගෙන තිබුණද , සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් කර තිබුනේ ඉන් අරමුණු 02 ක් සඳහා පමණි. තවද, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා ප්‍රමාණවත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර එකී ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කල යුතුය. | තිරසර සංවර්ධන සැලැස්මට අනුව වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බාහිර ආයතන වල අනුග්‍රාහකත්වය මත හා සභා ශ්‍රම දායකත්වය මත සිදු කල බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මෝටර්රථ තක්සේරු වාර්තාවෙන් හඳුනාගෙන ඇති භාවිතයට ගත නොහැකි වාහන අපහරනය කර ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කර ගිණුම් වලින් ඉවත් කල යුතුය. | ඉදිරියේදී අපහරනය කිරිමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (අ) පුරප්පාඩු වූ ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා කළමනාකරණ සහකාර 1 ශ්‍රේණියේ නිලධාරියෙකු පත් කර තිබුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුය. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අනුමැතිය මත 2015 වර්ෂයේ සිට අදාල තනතුරට නිත්‍ය නිලධාරියෙකු පත් කරන තෙක් ලේකම් තනතුරේ රාජකාරි ඉටු කිරිමට පත්කර ඇති බව දන්වමි. |
| (ආ) කළමනාකරණ සහකාර තනතුරු 01 ක අතිරික්තයක්, රියදුරු, වැඩ කේෂත්‍ර කම්කරුවල හා සෞඛ්‍ය කම්කරු තනතුරු පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. | කළමනාකරණ සහකාර තනතුරු 01 ක අතිරික්තයක් පවතින බව දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නිශ්ක්‍රිය හා ඌන උපයෝගිතා වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)2017 වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන යටතේ රු.2,996,332 ක වියදමින් නොදිරන අපද්‍රව්‍ය එක්රැස් කිරිම සඳහා ඉදි කළ ගොඩනැගිල්ලක් නිශ්ක්‍රියව පැවති අතර නොදිරන අපද්‍රව්‍ය බේල් | වත්කම් අදාල කාර්යය සඳහා යොදා ගත යුතුය. | බස්නාහිර පළාත් අප ද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හා පැවැත්වූ සාකච්ඡාවේදී බේලින් යන්ත්‍රය පොහොර වත්ත කසළ පිරවුම් බිමෙහි ස්ථාපිත කිරිමට එකඟ වූ බව හා ගොඩනැගිල්ල සෞඛ්‍ය අංශයේ කටයුතු |

| | | |
|---|---|---|
| කිරිම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලබාදී තිබු බේලින් යන්ත්‍රය නිශ්කාර්යව තිබුණි. | | සඳහා භාවිතා කරන බව දන්වමි. |
| (ආ) 2017 මාර්තු මාසයේ සිට වසා දමා ඇති ඥානසල මධ්‍යස්ථානය සඳහා භාවිතා කරන ලද පරිගණක 05 ක් ඇතුළු කාර්යාල උපකරණ රැසක් නාගොඩ උප කාර්යාලයේ නිශ්ක්‍රියව තිබුණි. | ඥානසල මධ්‍යස්ථානය විවෘත කර එය භාවිතය සඳහා ගත යුතුය. | වස්කඩුව පුස්තකාලය ඉදිරිපස නව ගොඩනැගිල්ලක ඥානසල ස්ථාපනය කිරිමට තීරණය කල බව හා අදාල උපකරණ නාගොඩ උප කාර්යාලයේ හා නාගොඩ මහජන පුස්තකාලයේ භාවිතය සඳහා යොදවා ඇති බව දන්වමි. |

3.4.2 වත්කම් ප්‍රත්‍යාගනනය නොකිරීම

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු සියළු ඉඩම් ගොඩනැගිලි වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කරනු වෙනුවට නව තක්සේරු වටිනාකම් ලබාගත් ඉඩම් ගොඩනැගිලි කිහිපයක වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කල යුතුය. | ගිණුම්ගත නොවූ ස්ථාවර වත්කම් තක්සේරු කර ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.4.3 වාහන උපයෝජනය

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ධාවනයෙන් ඉවත් කල ට්‍රැක්ටර් 02 ක්, ටේලර් 04 ක්, අත්ට්‍රැක්ටර් 02 ක් හා වතුර බවුසරයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරිමට හෝ අපහරනය කිරීමට කටයුතු කල යුතුය. | අපහරන කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

3.4.4 හඳුනාගත් පාඩු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අස්ථාන ගතවී තිබුණු පුස්තකාල පොත් 772 ක් සම්බන්ධයෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොත් අස්ථාන ගතවීම සම්බන්ධයෙන් පරික්ෂණයක් සිදු කර වගකිව යුතු නිලධාරින්ගෙන් අලාභ අය කිරීමට කටයුතු කළ යුතුය. | අලාභ අය කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

3.5 ප්‍රසම්පාදනය

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 04කට අමුද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත් සමිති වෙත රු.1,031,455 ක් ගෙවීම් කර තිබුණි. | ඉදිකල යුතු මාර්ග හඳුනාගෙන නිර්මාණ සකස් කර ඒ අනුව අමුද්‍රව්‍ය මිලදී ගත යුතුය. | අදාල ගොනු නිසියාකාරව හඳුනා ගත නොහැකිවීම නිසා පිළිතුරු ලබා දීමට නොහැකි බව දන්වමි. |